# නිදහස ලබා 64 වසර සැමරූ දා



ශ්‍රීලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පෙබරවාරි 4 වනදා අනුරාධපුර ශුද්ධ නගරයේ පැවති 64 වන ශ්‍රීලංකා නිදහස් දින උත්සවයේදී ලංකා ජනතාව ඇමතූ ආකාරයයි මේ.

**Sri Lanka's President Mr Mahinda Rajapakse addresses country's 64th National Independence Day celebrations held on the 4th of February 2012 in the sacred city of Anuradhapura in the North Central Province of Sri Lanka.**


Duke's Court Travel

Fly to Colombo

SriLankan Airlines fr £280 + Taxes
Qatar Airways fr £285 + Taxes
Kuwait Airways fr £220 + Taxes
Emirates fr £480 + Taxes
Etihad Airways fr £167 + Taxes
Oman Air fr £200 + Taxes
Jet Airways fr £155 + Taxes

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

204 King Street, London W6 0RA


## ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලය නිදහස් උත්සවය සමරයි!

ශ්‍රීලංකා මහකොමසාරිස් දොස්තර ක්‍රිස් නෝනිස් මහතා පෙබරවාරි 4 වන දින උදයේ මහකොමසාරිස් කායර්‍ාලයේ සඳළුතලයේ ශ්‍රීලංකා ජාතික කොඩිය ඔසවමින් නිදහස දින සැමරීමට මුලපිරූ අයුරුය මේ.





The Sri Lanka High Commission in the UK celebrated Sri Lanka's 64th Independence Day on the February 4th morning at the High Commission premises in London. The picture shows, the High Commissioner HC Dr Chris Nonis hoisting the Sri Lankan National Flag. That day a large gathering of Sri Lankans living in the UK participated, representing Buddhist, Hindu, Christian and Muslim faiths.

(*Photograph by* Tissa Madawela )

## ශ්‍රීලංකාවේ නිදහස සහ බටහිර න්‍යාපත්‍ර

**ගි**ය සතියේ ශ්‍රීලංකාවට **64** වෙනි නිදහස් උළෙලට දිනය උදාවූයේ ශ්‍රීලංකාවේ ඒකීය භාවය සහ ජාතික ස්ථාවරය විනාශ කරන්නට යළිත් වරක් ප්‍රතිගාමී සතුරන් කැසකවමින් සිටින අවස්ථාවකය. කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව රටෙහි උද්ගතවුණු අමුතුම සංකීර්ණ දේශපාලනික වාතාවරණය තුළ මෙම කුමන්ත්‍රණකාරයින්ට උන්ම අටවා ගත් බොරු ප්‍රෝඩාකාරී "මානව හිමිකම් සුරැකීමේ ව්‍යාපාරයන්ට " සරු තෝතැන්නක් වූ බව පැහැදිලිව පෙනේ.

ශ්‍රීලංකාව තුළ නොයෙක් අක්‍රමික තාවන්, නාස්තිය සහ දූෂණයන් සිදුවන බව බොරුවක් නොවේ. රහසක් නොවේ. ජනතාව එය හොඳින් දනිති. එයට එක් හේතුවක් වශයෙන් දැක්විය හැක්කේ වැරදි පෙන්වා දෙන්නට එහි ශක්තිමත් විපක්ෂයක් නොමැතිකමයි. එහෙත් එය ලංකාව පීනීවාහි මානව හිමිකම් කොමිසම හමුවට ගෙනගොස් දඬුවම් ලබා දෙන්නට තරම් කාරණයක් නොවන්නාසේම එවැන්නක් බලාපො-රොත්තුවෙන් මේ ඝෝෂා නගනවුන්ගේ යටි අදහස කුමක්දැයි ප්‍රශ්නයක් හා සැකයක්ද ද මතුවන්නේය.

මේ කුමන්ත්‍රණකාරයෝ ලබන මස පීනිවාහිදී ලංකාවට අයහපතක් සිදුවේ යයි බලාපොරොත්තුවන, ලංකාවේම ජීවත්වන, අහේ ඉදන් කන කන, මහා අසමජ්ජාතී හිවලුන් පිරික් වෙති.

මේ පිරිසම යුද්ධය පවතින කාල යේ ලංකාව යුද්ධයෙහි සහ පාලනයෙහි අදක්ෂ, අසාර්ථක රාජ්‍යයක් (failed State) ලෙස දක්වා ලංකාවේ ප්‍රශ්නය විසඳන්නට ජාත්‍යන්තර වශයෙන් මැදිහත්වීම අවශ්‍යයි කෑගසමින් බටහිර රටවලට ආයාචනා කළ පිරිසකි.

එහෙත් උන් කියූ "අසාර්ථක රාජ්‍යය" ඉතා සාර්ථක ලෙස ලොව භයානකම ත්‍රස්තවාදී කල්ලිය විනාශකර දැමූ විට කෑගැසූවෝ කටපියා ගත්හ. දැන් උන් යළිත් වරක් කරළියට පැමිණ පෙරසේ ඝෝෂාකරන්නට පටන්ගෙන සිටිති.

මේ පිරිසට සමාන්තරව ශ්‍රීලංකාව නුරුස්සන කොටසක් ද විදේශයේ සිටිති. යුද්ධය පවතින සමයේ සටන් විරාම දමන්නට, සාමසාකච්ඡා කැඳ වන්නට යෝජනා කළෝ ඔව්හු ය. යුද්ධය විසඳුමක් නොවේයයි කිවේ ද ඔව්හු ය. කොටි ත්‍රස්තවාදීන් ගැන අනු කම්පාවෙන් කතාකළෝ ඔව්හු ය.

කොටින්ට පක්ෂපාතීව සිටි ඇමරිකාව ඇතුළු බටහිර රටවල් බලා පොරොත්තු වූයේ ලංකාවේ පැවති යුද්ධය ඔවුන්ගේ න්‍යාය පත්‍රයට අනුව කෙරේය කියාය. එහෙත් ඒ අණකිරීම් වලින් පිටපැන ශ්‍රීලංකාව තමන්ට උචිත යුදමය ක්‍රියාදාමයන් අනුගමනය කර අවසානයේ සතුරා සමූල ඝාතනයකර දැමුවාය. එය ඇමරිකාව බ්‍රිතාන්‍යය ඇතුළු රටවල මනාපයට හේතු වුණේ නැත. ඔවුන් දුටුවේ එය ලංකාව ප්‍රමාණයට වැඩිය ඉදිමීමක් හැටියටය. දැන් ඔවුන් මේ සැරසෙන්නේ ශ්‍රී ලංකාවට හොඳ පාඩමක් උගන්වන්නටය.

♦ **ජනක පෙරේරා**

**Mt Lavinia Sri Lanka**




ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5

www.efastcash.biz

BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · COMMERCIAL BANK · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered

Strong. Safe. Reliable. MCG Mike Cooke Group

දින 7ම විවෘතයි

020 8886 4488

Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT